**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දුම්රිය ස්ථාන ආශ්‍රිත රථගාල් ටෙන්ඩර් කැදවා බදුලබාදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි.**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත රථගාල් වසරක කාලයකට බදු ලබාදීම පිනිස ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

| අනු අංකය | රථගාල | ප්‍රමාණය (පර්චස්) | අනු අංකය | රථගාල | ප්‍රමාණය (පර්චස්) |
|---|---|---|---|---|---|
| 01. | බැස්ටියන් මාවත | රූඩ් 1 පර් 5.95 | 14. | මීගමුව | 40 |
| 02. | කැප්ටන් උද්‍යාන කෝවිල පාර | 14 | 15. | කඳාන | 6 |
| 03. | ටීබී ජයා මාවත. | 102.45 | 16. | මාතර | 1.47 |
| 04. | මරදාන දුම්රිය ස්ථානය ඉදිරිපිට | රූඩ් 1 පර් 0.40 | 17. | වැලිගම | 1.32 |
| 05. | ප්‍රවාහන අමාත්‍යාංශය ඉදිරිපිට | රූඩ් 1 පර් 37.15 | 18. | දකුණු කළුතර | 2.29 |
| 06. | අම්බලන්ගොඩ II | 24.3 | 19. | උතුරු කළුතර | 25.34 |
| 07. | හික්කඩුව | 20.42 | 20. | බෙලිඅත්ත | 13.22 |
| 08. | වේයන්ගොඩ | 28.57 | 21. | කැකණදුර | 1.32 |
| 09. | මුත්තෙට්ටුගල | 40.40 | 22. | කඹුරුගමුව | 0.88 |
| 10. | කොළඹ ගෙදර | රූඩ් 1 පර් 16.90 | 23. | අහංගම | 27.55 |
| 11. | කුරුණෑගල | 31.41 | 24. | බූස්ස | 47.75 |
| 12. | මීරිගම | 26.5 | 25. | මඩකලපුව | 10.50 |
| 13. | මාදම්පෙ | 20 | | | |

ඉහත සඳහන් රථගාල් පිළිබඳ විස්තර ප්‍රසම්පාදන ලියවිලි යටතේ උපලේඛණ 01 හි දක්වා ඇත.

**01.සුදුසුකම්**

දෙපාර්තමේන්තු කොන්දේසි වලට යටත්ව වැඩිම මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරුට අදාල රථගාල් වෙන් වෙන්ව බදු ලබාදීම කටයුතු කරනු ඇත.

**02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම**

ප්‍රසම්පාදන ලියවිලි 2023 නොවැම්බර් මස 20 වන දින ප.ව.2.00 දක්වා දුම්රිය වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් හෝ රථගාල පිහිටි දුම්රිය ස්ථානයෙන් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍යා නිලධාරී වෙත හෝ අදාල දුම්රිය ස්ථානයේ දුම්රිය ස්ථානාධිපති වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු.2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නාලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) වෙත හෝ අදාල දුම්රිය ස්ථානය වෙත හෝ ඉදිරිපත් කළ යුතුය. ලංසු අයදුම්පතෙහි උපලේඛණ 01 හි සඳහන් එක් එක් රථගාල් සඳහා වෙනම සළකා ලංසු ඉදිරිපත්කළ යුතු අතර, ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක්ද ගෙවිය යුතුය. එක් ලංසු පෝරමයක් මගින් ලංසු ඉදිරිපත්කල හැක්කේ එක් රථගාලක් සඳහා පමනි.

**03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට ලබාගන්නා ලද ලංසු අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසි පරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනු පිටපත ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ "දුම්රිය ස්ථාන ආශ්‍රිත රථගාල් සඳහා මිල ගණන් කැඳවීම " යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2023 නොවැම්බර් මස 21 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඔල්කට් මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම**

2023 නොවැම්බර් මස 21 වන දින ප.ව.2.00 ට ඉහත 03 ජේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** ලංසු අයදුම් කිරීමට ප්‍රථම ඉහත සඳහන් රථගාල් පරික්ෂා කිරීම සඳහා අයදුම්කරුවන් හට අවස්ථාව ලබා දෙන අතර ඒ සඳහා අදාල දුම්රිය ස්ථානය මගින් අවසර ලබාගතයුතු වේ.

**06.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**07.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍යා නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
දුම්රිය මූලස්ථානය, ඔල්කට් මාවත, කොළඹ 10.